00065

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2017/18

**ESD1132/EPD3232**-විෂයමාලා අධ්‍යාපනය හා සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් හා ප්‍රායෝගික වැඩ

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2019.02.24 — වේලාව - ප.ව.02.00 - ප.ව.04.00 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පමණක් පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ළමා වියේ දරුවන්ගේ සියුම් චාලක හැකියා සංවර්ධනය වන ක්‍රියාකාරකම් පිළිබඳව විස්තර කරන්න.
02. බහුවිධ බුද්ධි න්‍යායයෙහි අටවැදෑරුම් නිපුණතා හඳුන්වන්න.
03. මුල් ළමාවියේ දරුවන් සඳහා එළිමහන් ඉගෙනුම් පරිසරයක් තිබීමේ වාසි හතරක්(04) පැහැදිලි කරන්න
04. පෙර පාසල් ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා රූකඩ භාවිතයේ වැදගත්කම පෙන්වා දෙන්න.
05. සංගීතය හා රිද්මයානුකූල චලන හරහා සංවර්ධනය කළ හැකි කුසලතා හතරක් (04) දක්වන්න.
06. ළමා චිත්‍රවල ප්‍රධාන අවදි නම් කරන්න.
07. කුඩා දරුවන් වෙනුවෙන් යොදාගත හැකි විවිධ රූකඩ වර්ග හතරක් (04) දක්වන්න.
08. පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපනයේ දී ළමා නාට්‍යමය ක්‍රියා යොදා ගැනීමේ වැදගත්කම පැහැදැලි කරන්න.

(ලකුණු 5 X 8 = 40)

## 2 වන කොටස

09. (I) සංගීතය ආශ්‍රිත නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල නිරත වන විට ළමයින් කෙරෙන් දැකිය හැකි චර්යා ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 08)

(II) "නිර්මාණාත්මක ක්‍රියාකාරකම් කිරීමේ දී දරුවන්ට නිදහස ලබා දිය යුතු වේ." මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද? සුදුසු උදාහරණ දක්වමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 12)

10. (I) දරුවන් සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී පෙර පාසල් ගුරුවරියක විසින් සැලකිලිමත් විය යුතු කරුණු හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(II) මුල් ළමාවියේ දරුවන්ගේ සංවර්ධනය සඳහා කතන්දර හා ළමා නාට්‍ය යොදා ගැනීමේ වැදගත්කම උදාහරණ සහිතව විශ්ලේෂණය කරන්න. (ලකුණු 12)

11. (i) නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා යොදාගත හැකි ඉවතලන හා ස්වභාවික ද්‍රව්‍ය දහයක් **(10)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(ii) පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපනයේ දී නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා ඉවතලන ද්‍රව්‍ය යොදා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 15)

12. (i) "ළමාවියේ දරුවන්ගේ චිත්තවේග සම්බන්ධ පසුබිම හඳුනාගැනීමේ දී ළමා චිත්‍ර යොදා ගත හැකිය."
ඔබ මෙම ප්‍රකාශය හා එකඟ වන්නේ ද?
සුදුසු උදාහරණ සහිතව ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.
(ලකුණු 10)

(ii) ළමා චිත්‍ර ඇඟයීමේ දී පෙරපාසල් ගුරුවරිය විසින් සැලකිලිමත් විය යුතු කරුණු **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) පෙරාපසල් හා ප්‍රාථමික මට්ටම්වලදී ළමා නාට්‍ය හා කතන්දර සඳහා යොදා ගත හැකි ද්‍රව්‍ය හා ආධාරක **පහක් (05)** ලයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(ii) ළමා නාට්‍ය හා කතන්දර සඳහා ඉහතින් ඔබ දක්වන ලද ද්‍රව්‍ය හා ආධාරක යොදා ගන්නා ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)

හිමිකම් ඇවිරිණි.